# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,991 - 2016 ඔක්තෝබර් මස 28 වැනි සිකුරාදා - 2016.10.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2120 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2135 |


*සැ. යු.* - (i) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2016 අගෝස්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2016 අගෝස්තු මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 නොවැම්බර් මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 නොවැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


2117- B 81110— 5,403 (2016/10)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

### ඡයාරූප ශිල්පී සහ වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීම

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ඡායාරූප ශිල්පී සහ වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| තනතුරු සංඛ්‍යාව : | ඡායාරූප ශිල්පී | - | 01 |
| | වීඩියෝ කැමරා ශිල්පී | - | 01 |

01. බඳවා ගැනීමේ ක්‍රමය :-

නිවේදනයේ දක්වෙන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත හා ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම් :

*අධ්‍යාපන සුදුසුකම්.*—අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී ගණිතය සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06 ක් සමත්වීම.

*වෘත්තීය සුදුසුකම්.*—ඡායාරූපකරණය/වීඩියෝ කැමරාකරණය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5ට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

*පළපුරුද්ද.*—තනතුරට අදාළ රාජකාරි සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සළකනු ලැබේ.

*කායික සුදුසුකම්.*—සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

*වෙනත්* : (i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි හා ඒවාට පැවරෙන කාර්යයන් :

(*අ*) *ඡායාරූප ශිල්පී තනතුර* - නිශ්චල ඡායාරූප ගැනීම, මුද්‍රණ හා ඡායාරූප රසායනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු, ඡායාරූප ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු, ඡායාරූප ලේඛන පවත්වාගෙන යාම හා සුචිගත කිරීම, ඡායාරූප අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම, වීඩියෝ ඡායාරූපකරණය, ෆොටෝ ගෙමිටු ක්‍රමයට ඡායාරූප ගැනීම හා ඩිජිටල් ක්‍රමයට අනුව ඡායාරූප සකස් කිරීම, පරිගණක ආශ්‍රිත මුද්‍රණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්,

(*ආ*) *වීඩියෝ කැමරා ශිල්පී තනතුර* - වීඩියෝ කිරීම, විශේෂ වැදගත්කමකින් යුතු අවස්ථා රූපගත කිරීම හා සංස්කරණය, සංස්කරණ උපකරණ හා සංස්කරණ මැදිරිය භාරව කටයුතු කිරීම හා එහි නඩත්තු කටයුතු, වීඩියෝ පට ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු, වීඩියෝ පට ලේඛනයක් පවත්වාගෙන යාම හා සුචිගත කිරීම, වීඩියෝ කැමරා අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, ඕනෑම වර්ගයකට අයත් කැමරාවක් පරිහරණය කිරීම, ඩිජිටල් ක්‍රමයට අනුව රූප රාමු ලබාගැනීම හා සකස් කිරීම, පරිගණක ආශ්‍රිත සංස්කරණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්.

04. වයස :

| | |
|---|---|
| අවම සීමාව | : අවුරුදු 18 |
| උපරිම සීමාව | : අවුරුදු 35 |

05. මාසික දීමනාව - රු. 17,508
ගැළපුම් දීමනාව - රු. 9,831
ජීවන වියදම් දීමනාව - රු. 7,800

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී හා ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබාදෙනු ලබන ලකුණු පරිපාටිය :

(අ) ප්‍රායෝගික පරීක්ෂණය :

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| (අ) ඡායාරූප ශිල්පී තනතුර | | 40 |
| ● කැමරාවක් ක්‍රියාකර වීම හා රූපගත කිරීම | 60 | |
| ● අලෝකය සැපයීම හා නවීන තාක්ෂණික ක්‍රම භාවිතය | 20 | |
| ● පැහැදිලි ඡායාරූප ගැනීම | 20 | |
| ***එකතුව*** | 100 | |
| (ආ) වීඩියෝ කැමරා ශිල්පී තනතුර | | 40 |
| ● වීඩියෝ කැමරා හා ඊට අදළ උපකරණ ක්‍රියාකරවීම | 30 | |
| ● ප්‍රවෘත්ති ආවරණයට සුදුසු පරිදි දර්ශන තෝරාගැනීම හා දත්ත එක්රැස් කිරීම | 20 | |
| ● රූපවාහිනි දර්ශනවලට අදළව ස්වාභාවික ආලෝකය උපයෝගි කර ගැනීම හා රූගත කිරීම සඳහා විදුලි ආලෝකය යෙදීම | 20 | |
| ● පරිගණක තාක්ෂණ භාවිතයෙන් ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ හැකියාව | 10 | |
| ● කැසට්පට පටිගත කිරීමේ තාක්ෂණය හා ඊට අදළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 10 | |
| ● රූපවාහිනි මැදිරි තුළ රූගත කිරීම පිළිබඳ සාමාන්‍ය දැනුම | 10 | |
| ***එකතුව*** | 100 | |

(ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදළ නොවේ |
| 02. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 03. අතිරේක පළපුරුද්ද | 25 | |
| 04. පරිගණක හැකියාව | 20 | |
| 05. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | 15 | |
| 06. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |

*සටහන* : ප්‍රායෝගික පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය යන දෙකෙන්ම ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතාව අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :
සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික කරන ලද පිටපත් හා නිසි පරිදි සකස් කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත දැක්වෙන අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(අ) අයදුම්පත් 2016.11.18 දිනට හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල

(ආ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම්කෙලවරේ අයදුම් කරනු ලබන තනතුරේ නම සඳහන් කළ යුතුය.

(ඇ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයෙහි ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

ලේකම්,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙහි පුරප්පාඩුව පවත්නා ඡායාරූප ශිල්පී සහ වීඩියෝ කැමරා ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීම

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මුලකුරු සමග නම : (මයා/මිය/මෙනවිය)
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරෙන්) :————.

01.01 මුලකුරු වලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරෙන්) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. උපන් දිනය :————.

වර්ෂය :————. මාසය :————. දිනය :————.

03.01 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - M , ස්ත්‍රී - F) : ☐

05. විවාහක/ අවිවාහක බව :————.

06. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්)
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසි (කැපිටල් අකුරෙන්) :————.

07. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

08. ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

(අ) අධ්‍යාපන සුදුසුකම් - අ. පො. ස. (සා. පෙළ)

වර්ෂය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ. පො. ස. (උ. පෙළ)

වර්ෂය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

(*ආ*) වෘත්තීය සුදුසුකම් :————.
(*ඇ*) පළපුරුද්ද :————.
(*ඈ*) වෙනත් සුදුසුකම් :————.

09. අයදුම්කරුගේ සහතිකය :

..................වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකුසේ සලකා නොමැති බවත්, සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

10-1253/1

## මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

### ඡායාරූප ශිල්පී සහායක තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීම

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ඡායාරූප ශිල්පී සහායක තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු සංඛ්‍යාව : ජායාරූප ශිල්පී සහායක - 01

01. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දැක්වෙන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්* :

*අධ්‍යාපන සුදුසුකම්.*—අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

*වෘත්තීය සුදුසුකම්.*—අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*පළපුරුද්ද.*—අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*කායික සුදුසුකම්.*—සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි හා ඒවාට පැවරෙන කාර්යයන් :

ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවයකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහුකාර්ය සේවා ගණයක් ලෙස මෙම සේවා ගණය සැලකේ. මෙම කාර්ය පථයනට අයත් කාර්ය අතුරින් ඕනෑම කාර්යභාරයක් දෙපාර්තමේන්තු ප්‍රධාන/පත්කිරීම් බලධරයා විසින් මෙම සේවා ගණයට අයත් නිලධරයෙකුට පවරනු ලැබිය හැකිය.

මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

04. වයස :

| | |
|---|---|
| අවම සීමාව | : අවුරුදු 18 |
| උපරිම සීමාව | : අවුරුදු 45 |

05.

| | |
|---|---|
| මාසික දීමනාව : | රු. 14,234 |
| ගැළපුම් දීමනාව : | රු. 10,006 |
| ජීවන වියදම් දීමනාව : | රු. 7,800 |

06. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාදෙනු ලබන ලකුණු පරිපාටිය :

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය 100%* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 25 | |
| පළපුරුද්ද | 40 | |
| තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳ ලබා ඇති සුදුසුකම් | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| **එකතුව** | 100 | |

*සටහන* : ප්‍රායෝගික පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය යන දෙකෙන්ම ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතාව අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික කරන ලද පිටපත් හා නිසි පරිදි සකස් කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත දැක්වෙන අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

(*අ*) අයදුම්පත් 2016.11.18 දිනට හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ලේකම්, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල

(*ආ*) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම්කෙලවරේ අයදුම්කරනු ලබන තනතුරේ නම සඳහන් කළ යුතුය.

(*ඇ*) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයෙහි ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

ලේකම්,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙහි පුරප්පාඩුව පවත්නා ඡායාරූප ශිල්පී සහායක තනතුර සඳහා බඳවා ගැනීම

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. මුලකුරු සමඟ නම : (මයා./මිය./මෙනවිය) :
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරෙන්) :————.

01.01 මුලකුරුවලින් හැඳින්වෙන නම (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරෙන්) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. උපන් දිනය :

වර්ෂය :————. මාසය :————. දිනය :————.

03.01 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - M , ස්ත්‍රී - F) : ☐

05. විවාහක/ අවිවාහක බව :————.

06. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්)
(i) සිංහලෙන්/දෙමළෙන් :————.
(ii) ඉංග්‍රීසි (කැපිටල් අකුරෙන්) :————.

07. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

08. ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

(අ) අධ්‍යාපන සුදුසුකම් - අ. පො. ස. (සා. පෙළ) :

වර්ෂය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ. පො. ස. (උ. පෙළ) ෑ

වර්ෂය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

(ආ) වෘත්තීය සුදුසුකම් :————.
(ඇ) පළපුරුද්ද :————.
(ඈ) වෙනත් සුදුසුකම් :————.

09. අයදුම්කරුගේ සහතිකය ෑ

……………………වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකුසේ සලකා නොමැති බවත්, සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 නොවැම්බර් මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | නාඋල | ගගල පල්ලේසිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා මාතලේ නැගෙනහිර විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

10-1541

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 නොවැම්බර් මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | කොත්මලේ | මැදපනේ කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කොත්මලේ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය |

10-1539

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 නොවැම්බර් මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ඔක්තෝබර් මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | කඩවත් සතර හා ගඟවට කෝරළය | කඩවත් සතර හා ගඟවට කෝරළය කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

10-1540

## අධිකරණ අමාත්‍යාංශය

### අධිකරණ අමාත්‍යාංශයේ ජලනල කාර්මික ශිල්පී, විදුලි කාර්මික ශිල්පී, පෙදරේරු ශිල්පී සහ වඩු වැඩ ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීම

අධිකරණ අමාත්‍යාංශයේ ජලනල කාර්මික තනතුරු 03ක්, විදුලි කාර්මික ශිල්පී තනතුරු 02ක් පෙදරේරු ශිල්පී තනතුරු 05ක් සහ වඩු වැඩ ශිල්පී තනතුරු 05ක් සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම්* :

ජලනල කාර්මික ශිල්පී
විදුලි කාර්මික ශිල්පී
පෙදරේරු ශිල්පී
වඩු වැඩ ශිල්පී

} අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

02. *වෘත්තීය සුදුසුකම්* :

ජලනල කාර්මික ශිල්පී — ජලනල කාර්මික තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N. V. Q.) සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

විදුලි කාර්මික ශිල්පී — විදුලි කාර්මික තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N. V. Q.) සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

පෙදරේරු ශිල්පී — පෙදරේරු ශිල්පී (පෙදරේරු) තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N. V. Q.) සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වඩු වැඩ ශිල්පී — වඩු වැඩ ශිල්පී (වඩු කාර්මික) තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N. V. Q.) සිව්වැනි (04) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

03. *පළපුරුද්ද* :

ජලනල කාර්මික ශිල්පී - ජලනල කාර්මික ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම
විදුලි කාර්මික ශිල්පී - විදුලි කාර්මික ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම
පෙදරේරු ශිල්පී - පෙදරේරු ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම
වඩු වැඩ ශිල්පී - වඩු කාර්මික ක්ෂේත්‍රයේ වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම

04. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

05. *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

06. *වෙනත්* :

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(II) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(III) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් (1 සිට 5 දක්වා) සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

07. *වැටුප් පරිමාණය :*
මාසිකව.—රු. 25,790-10x270-10x300-10x330-12x350-38990 (PL 3 2016) 2016.02.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානවලට අනුකූලව උපලේඛන II සඳහන් පරිදි වැටුප් හිමි වේ.

08. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :* වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

09. *රාජකාරි ස්වභාවය :*
*ජලනල කාර්මික ශිල්පී :*

අධිකරණ අමාත්‍යාංශයට අයත්, :—

(i) ගොඩනැගිලිවලට ජලය සැපයීම සඳහා ඇති භූගත ජල ටැංකි නිසි ක්‍රියාකාරීත්වයෙන් පවත්වා ගැනීම,
(ii) ජල පොම්ප ක්‍රියා කරවීම හා නඩත්තුව,
(iii) මළ අපද්‍රව්‍ය පද්ධතියේ නඩත්තුව හා අළුත්වැඩියාවන් ඉටු කිරීම,
(iv) වැසිකිළි උපාංග හා ජල නල උපාංග නඩත්තුව හා අළුත්වැඩියාවන් ඉටු කිරීම,
(v) ගොඩනැගිලිවල ජල සැපයුම නිසියාකාරව පවතින බවට වගබලා ගැනීම,
(vi) හදිසි අවස්ථාවලදී පරිශ්‍රය තුළ ජල හා අපද්‍රව්‍ය පද්ධතියේ සවි කිරීම් හා නඩත්තු කටයුතු,
(vii) අමාත්‍යාංශ පරිශ්‍රයට ජල සැපයෙන ජල මීටරය සම්බන්ධ යම් ගැටළුවක් වෙතොත් ඒ පිළිබඳව සොයා බලා වාර්තා කිරීම,
(viii) කාර්යක්ෂමව ජලය භාවිතය සහ ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව දිනපතා සොයා බලා වාර්තා කිරීම,
(ix) අමාත්‍යාංශ පරිශ්‍රයේ ඉදිරිපස ඇති පොකුණ සහ ජල මල නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාම,
(x) අමාත්‍යාංශ ලේකම් හෝ බලය පවරනු ලබන නිලධාරියකු විසින් පවරනු ලබන රාජකාරි.

**විදුලි කාර්මික ශිල්පී :**

අධිකරණ අමාත්‍යාංශයට අයත්, :—

(i) ගොඩනැගිලිවලට විදුලිය සවි කිරීම, පිළිගත් ප්‍රමිතීන්ට අනුව පවතින හා ක්‍රියාත්මක වන බව පරීක්ෂා කිරීම හා නඩත්තුව,
(ii) වායු සමීකරණවල විදුලි සැපයුමට අදාළ නඩත්තු කටයුතු ඉටු කිරීම,
(iii) ගොඩනැගිලිවල විදුලි තත් ඇදීම, නඩත්තුව හා අළුත්වැඩියාව,
(iv) විදුලි සෝපානයේ ක්‍රියාකාරීත්වය සඳහා විදුලි සැපයුම පරීක්ෂා කිරීම සහ යථා තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම,
(v) සියලුම ජල පොම්පවල විදුලිය සැපයුම නියමාකාරව පවත්වා ගැනීම හා අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කිරීම,
(vi) ගොඩනැගිලිවල විදුලිය සැපයුම හා සම්බන්ධතා අඛණ්ඩව ක්‍රියාත්මක වන තත්ත්වයෙන් පවත්වාගෙන යාමට වගබලා ගැනීම හා විදුලි ජෙනරේටරයේ නඩත්තු කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම,
(vii) විශේෂ අවස්ථාවල දී පරිශ්‍රය තුළ අවශ්‍ය විදුලිය සවි කිරීම හා නඩත්තු කටයුතු ඉටු කිරීම,
(viii) අමාත්‍යාංශ ලේකම් හෝ බලය පවරනු ලබන නිලධාරියකු විසින් පවරනු ලබන රාජකාරි.

**පෙදරේරු ශිල්පී :**

අධිකරණ අමාත්‍යාංශයට අයත් :—

(I) ගොඩනැගිලිවල හා වෙනත් ඉදිකිරීම්වල දී පෙදරේරු ක්ෂේත්‍රයට අදළ නඩත්තු කටයුතු සිදු කිරීම
(II) අමාත්‍යාංශ ලේකම් හෝ බලය පවරනු ලබන නිලධාරියකු විසින් පවරනු ලබන රාජකාරි

**වඩු වැඩ ශිල්පී :**

අධිකරණ අමාත්‍යාංශයට අයත් :—

(I) ගොඩනැගිලි හා වෙනත් ඉදි කිරීම්වලදී වඩු කාර්මික ක්ෂේත්‍රයට අදළ නඩත්තු කටයුතු සිදු කිරීම,
(II) අමාත්‍යාංශ ලේකම් හෝ බලය පවරනු ලබන නිලධාරියකු විසින් පවරනු ලබන රාජකාරි.

10. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :-

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

11. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කර ගත් අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර, 2016.11.28 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "අධිකරණ අමාත්‍යාංශයේ ජලනල කාර්මික ශිල්පී තනතුර ''අධිකරණ අමාත්‍යාංශයේ විදුලි කාර්මික ශිල්පී තනතුර''/''අධිකරණ අමාත්‍යාංශයේ පෙදරේරු ශිල්පී තනතුර''/''අධිකරණ අමාත්‍යාංශයේ වඩු වැඩ ශිල්පී තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

12. *වෘත්තීය පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ක්‍රමය* :

ජලනල කාර්මික ශිල්පී :

| *විෂය* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| ජල සම්පාදනය හා නඩත්තුව, පල්දොරු අලුත්වැඩියාව සහ නඩත්තු | ගෘහස්ථ සහ මහල් ගොඩනැගිලි සම්බන්ධ ජල නල එලීම, නඩත්තු කටයුතු, ජල මෝටර් සවි කිරීම, ජල අපවහනය, පල්දෝරු නල පද්ධති ස්ථාපනය, මූලික සැලසුම් කියවීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික දැනුම | පැය 03 | 100 | 40 |

විදුලි කාර්මික ශිල්පී :

| *විෂය* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| විදුලිය සැපයීම, අලුත්වැඩියාව සහ නඩත්තු | විදුලි පරිපථ, මහල් ගොඩනැගිලි සඳහා විදුලි රැහැන් ඇදීම, විදුලි රැහැන් ධාරිතාවන් තෝරා ගැනීම ඇතුළු ගෘහස්ථ සහ මහල් ගොඩනැගිලි සඳහා විදුලිය සැපයීම, විදුලි නඩත්තු කටයුතු සහ විදුලි සැලසුම් කියවීමේ සහ ඇඳීමේ මූලික දැනුම, විදුලි ජනක යන්ත්‍ර නඩත්තුව පිළිබඳ ප්‍රායෝගික දැනුම | පැය 03 | 100 | 40 |

වඩු වැඩ ශිල්පී (වඩු කාර්මික) තනතුර :

| *විෂය* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| වඩු වැඩ ක්ෂේත්‍රයේ මූලික දැනුම | සැලසුම් හා සරල ඇඳීම් තේරුම් ගැනීම, කාර්යයට සුදුසු දව හඳුනා ගැනීම ඉදිකිරීම් අංශය හා ගෘහ භාණ්ඩ කටයුතු පිළිබඳ අවබෝධය, මූලික අත් ආයුධ හඳුනාගැනීම හා පරිහරණය පිළිබඳ අවබෝධය | පැය 03 | 100 | 40 |

පෙදරේරු ශිල්පී (පෙදරේරු) තනතුර :

| විෂයය | විෂයය නිර්දේශය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| පෙදරේරු ක්ෂේත්‍රයේ මූලික දැනුම | ඉදිකිරීම් කර්මාන්තයේ භාවිතා වන බදාම, කොන්ක්‍රීට් මිශ්‍රණ පිළිබඳ දැනුම, පෙදරේරු වෘත්තියේ භාවිතා වන උපකරණ පිළිබඳ දැනුම, සැලසුම් සඳහා ඇස්තමේන්තු සැකසීම | පැය 03 | 100 | 40 |

13. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්‍රමය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| 02. අතිරේක පළපුරුද්ද | 50 |
| 03. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| 04. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 |
| එකතුව | 100 |

*සටහන.*—වෘත්තීය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණට කැඳවනු ලැබේ. වෘත්තීය හා ව්‍යුහගත පරීක්ෂණ දෙකෙන්ම ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරෙන් කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

14. ඉල්ලුම්පත්‍රය පහත දැක්වෙන ආකෘති පත්‍රය ප්‍රකාරව නිවැරදිව සම්පූර්ණ කළ යුතුය. අදාළ ආකෘති පත්‍රයට වෙනස් අයදුම්පත් සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි තැපෑලේදී නැති වූ බවට කරන පැමිණිලි සලකා බලනු නොලැබේ.

15. යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

16. එක් අයදුම්කරුවෙක් තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් අදළ තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතුය.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වේ.

පද්මසිරි ජයමාන්න,
ලේකම්.

2016 ඔක්තෝබර් මස 11 වැනි දින,
අධිකරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

ආදර්ශ අයදුම්පත්‍රය

**අධිකරණ අමාත්‍යාංශයේ ජලනල කාර්මික ශිල්පී/විදුලි කාර්මික ශිල්පී /පෙදරේරු ශිල්පී/ වඩුවැඩ ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීම**

අංකය :—————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ඉල්ලුම් කරන තනතුර ඃ

ජලනල කාර්මික ශිල්පී - 1
විදුලි කාර්මික ශිල්පී - 2
පෙදරේරු ශිල්පී - 3
වඩු වැඩ ශිල්පී - 4

☐

(ඉල්ලුම් කරනු ලබන තනතුරට අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. සම්පූර්ණ නම : සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.
02. මුලකුරු සමග නම : සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.
03. පුද්ගලික ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් :—————.
ඉංග්‍රීසියෙන් :—————.
04. උපන් දිනය :—————.
05. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස ඃ- අවු. :—————. මාස :—————. දින :—————.
06. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
08. විවාහක/අවිවාහක බව :—————.
09. දුරකථන අංකය :—————.
10. අධ්‍යාපන සුදුසුකම් :—————.

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය ඃ

වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ. පො. ස. (උසස් පෙළ) විභාගය ඃ

වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |

11. වෘත්තීය සුදුසුකම් :————.
(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි)

12. පළපුරුද්ද :————.
(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි)
(10, 11, 12 හි සඳහන් කරන ලද තොරතුරුවලට අදළ සහතිකවල සහතික කළ පිටපත් අමුණන්න.)

13. වෙනත් සුදුසුකම් :————.

14. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කරනු ලබන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, තෝරා පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................... යන අය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ............ තනතුරේ ස්ථිර/අනියම්/තාවකාලික, නිලධාරියෙකු/නිලධාරිණියක වශයෙන් සේවය කරන බවත්, පෞද්ගලික ලිපිගොනුව අනුව ඔහු/ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, මෙම නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇති/නැති බවත් ඔහු/ඇය ඉහත කී තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදාහැරිය හැකිය/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

10-1711

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2016

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ජාතික විශ්ව විද්‍යාල මගින් විද්‍යාවේදී හෙද උපාධිය, ලබා ඇති පහත සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්කරුවන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන හා පවතින පුරප්පාඩු අනුව වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් 25% ක් විද්‍යාවේදී හෙද උපාධිය මත අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් තෝරා ගනු ලැබේ.

2. *තනතුරට අදළ අධ්‍යාපන සුදුසුකම් :*
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේ දී හෙද උපාධිය (Bsc. Nursing) සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. *කායික සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :*
(*අ*) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.
(*ආ*) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.
(*ඇ*) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
(*ඈ*) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(*ඉ*) ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය.
(*ඊ*) ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය.
(*උ*) 2016.11.25 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.
(*ඌ*) අදළ උපාධිය බලපැවැත්වෙන දිනය 2016.11.25 දිනට පෙර දිනයක් විය යුතු ය.

4. *අයදුම්කළ යුතු ආකාරය* :

(*අ*) මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතු ය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදසි භාවිත කළ යුතු ය. අයදුම්පතේ 1 සිට 12 දක්වා පළමු පිටුවේ ද. 13 සිට 15 දක්වා දෙවන පිටුවේ ද, 16 තෙවන පිටුවේ ද වන පරිදි සකස් කල යුතු ය.

(*ආ*) අයදුම්කරුවන් රු. 300 මුදලක් ලංකා බැංකුව තැපැල්බේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට බැරකර අදළ ලදුපත් අයදුම්පතෙහි කොටුව තුළ ඇලවිය යුතු ය. එම ගාස්තු කවර හේතුවක් නිසා ආපසු නොගෙවන අතර වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

(*ඇ*) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ රජයේ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමාදන විනිශ්චයකාර-වරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360 කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතු ය.

(*ඈ*) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ ''හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2016'' වශයෙන් හා අදළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර අධ්‍යක්ෂ පාලන 01, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ''සුවසිරිපාය'' අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයට 2016.11.25 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*සටහන*.-ඉහත (2) හා (3) යටතේ දක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2016.11.25 දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත් අදළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබා ගත යුතු ය.

6. මෙම පොදු චක්‍රලේඛයේ දක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා 2016.11.25 දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බව ද දන්වා එවනු නොලැබේ.

7. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් අතුරින් අයදුම්කරුවන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරා ගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

*සටහන* :

(*අ*) සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවා ගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

(*ආ*) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාට පුහුණුවට බඳවා ගන්නා බවත් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ නුසුදුසු වූ හා තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පලකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දනුම් දෙනු නොලැබේ.

8. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් හා සත්‍ය බවට තමා විසින්ම සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) උප්පැන්න සහතිකය,
(*ආ*) උපාධි සහතිකයේ මුල් පිටපත හා GPA අගය දක්වෙන සහතිකය (මෙම සහතිකවල සත්‍ය බවට සහතික කළ පිටපත් අයදුම්පත සමඟ එවිය යුතු ය.),
(*ඇ*) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

9. *පුහුණු කිරීමේ පටිපාටිය* :

| *පාඨමාලාව* | *එම පාඨමාලාවේ කාලසීමාව* | *භාෂා මාධ්‍යය* |
|---|---|---|
| හෙද අනුස්ථාපන හා සමායෝජන | මාස 06 | ඉංග්‍රීසි |

(අ) තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට අනුයුක්ත කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂාවෙන් හැදෑරිය යුතු ය.

(ආ) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය අවසානයේ දී සාර්ථකව එය නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටුදයක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවකදී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැක.

(ඉ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි දැක්වෙන විධිවිධානවලට යටත්ව සිසු හෙද/හෙදියන්ට තෙවන වසරේදී ලබා දෙන මාසික දීමනාව ලබා දෙනු ඇත.

(ඊ) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිමකරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් අදළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු අතර එම ගිවිසුම හා ඇපකරය පුහුණුවට ලියාපදිංචිය ලබන දිනයේම අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ශාඛාව වෙත බාර දිය යුතුය. පුහුණු කාල සීමාව තුළදී පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් හෝ ඉහත (ඇ) වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් අදළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද විය හියදම් හා ඇපකරයට අදළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :

පුහුණුව අවසානයේ අදළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදනය කිරීම සිදුකරන/නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදනය කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු අනුව 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛනය I හි සඳහන් MT-7-2016 වැටුප් කේතයට අදළ වැටුප මත III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරට පත් කිරීමට කටයුතු කෙරේ. තනතුරට පත් කලහොත් වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන ii හි දැක්වෙන විධිවිධාන පරිදි බව සැලකිය යුතු ය.

11. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නිත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම් අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුලදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. මෙම පුහුණු කාල සීමාව තුළදී වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එවන්නක් සිදු කල බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කිරීමට සිදු කරනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ සේවකයින්ට අදළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, රාජ්‍ය සේවා කොමිෂන්

සහා කාර්ය පටිපාටික රීතිවලට, මුදල් රෙගුලාසිවලට, හෙද ව්‍යවස්ථාවට හා එයට වරින්වර සිදු කරනු ලබන සංශෝධනවලට හා කලින්කලට බලපවත්නා රජයේ පොදු රෙගුලාසිවලට යටත් වනු ඇත.

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාශය බැඳී නොසිටී. එසේ ලබා දෙන්නේ නම් ඒ සඳහා තක්සේරු නිවාස හා කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම පොදු චක්‍ර ලේඛය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උද වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම පොදු චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

අනුර ජයවික්‍රම,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශය.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
සුවසිරිපාය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

## ආදර්ශ අයදුම්පත්‍රය

***හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේ දී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2016***

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පොදු චක්‍රලේඛය හොඳින් කියවා බලන්න.

1. (*අ*) මුලකුරු සමග අගට යෙදෙන නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

3. තැපැල් ලිපිනය :—————.

4. ස්ථිර ලිපිනය :—————.

5. දුරකථන අංකය :—————.

6. (*අ*) පදිංචි දිස්ත්‍රික්කය :—————.
(*ආ*) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක් ද? :————.

7. (*අ*) උපන් දිනය :
වර්ෂය :———. මාසය :———. දිනය :————.

(*ආ*) 2016 ……… දිනට වයස :

අවුරුදු :———. මාස :———. දින :———.

8. ස්ත්‍රී/පුරුෂභාවය - ස්ත්‍රී ☐ පුරුෂ ☐

(අදාළ කොටුවේ x ලකුණ යොදන්න.)

9. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියක්ද යන වග -

ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ x ලකුණ යොදන්න.)

10. විවාහක/අවිවාහක බව - විවාහක ☐ අවිවාහක ☐
(අදාළ කොටුවේ x ලකුණ යොදන්න.)

11. උස : අඩි :—————.අඟල් :—————.

12. *අධ්‍යාපන සුදුසුකම් :*

| *සමත් වූ උපාධිය* | *උපාධිය වලංගු වන දිනය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA)* | *විශ්ව විද්‍යාලය* | *අධ්‍යයන වර්ෂය* |
|---|---|---|---|---|
| | | | | |

13. ඔබ කවද හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද ? ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ X ලකුණ යොදන්න.)

එසේ නම් හේතු :—————.

14. *අයදුම්කරුගේ සහතිකය :*

මා විසින් පොදු චක්‍රලේඛය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් වන බව ද මම දන සිටිමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, මට අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් හොඳින් අවබෝධ කරගෙන සිටින බවත් ප්‍රකාශ කර සිටිම.

| රු. 300 ගෙවා ලබාගත් බැංකු ලදුපත මෙහි අලවන්න. |
|---|

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ
අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද ඔහු/ඇය ................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

16. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදළ නොවන වචන කපා හරින්න.)

ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන ................. මහතා/ මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ................. තනතුර දරන බව මින් සහතික කරමි.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර මොහු/මැය තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිදු අයුරකින් දනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ,
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

10-1806

---

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 /2017**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 පෙබරවාරි මස ආරම්භකොට පේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2016 වසරේ ඔක්තෝබර් මස 28 වැනි දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරින්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත් වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. විෂය නිර්දේශ.—I වැනි කාර්යක්ෂමතා කඩඉම පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරින් I වැනි කාර්යක්ෂමතා කඩඉම සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. මූල්‍ය ක්‍රම | පැය 02 | 100 | 40 |
| 2. පරිපාලනය | පැය 02 | 100 | 40 |
| 3. දෙපාර්තමේන්තු රෙගුලාසි - 1 | පැය 02 | 100 | 40 |
| 4. දෙපාර්තමේන්තු රෙගුලාසි - 2 | පැය 03 | 100 | 40 |

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය ඃ

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01 මූල්‍ය ක්‍රම | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (X වැනි පරිච්ඡේදය හැර) |
| 02 පරිපාලනය | (අ) කාර්යාල ක්‍රම, කාර්යාල කළමනාකරණය හා කාර්යාල සංවිධානය කිරීම පිළිබඳ දැනුම<br>(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතීන්හි I - XXII දක්වා වූ පරිච්ඡේද සහ ආයතන සංග්‍රහයේ VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XIX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII පරිච්ඡේද |
| 03 දෙපාර්තමේන්තු රෙගුලාසි - 1 | සත්ත්ව පනත, සත්ත්ව රෝග පනත හා ආනුෂාංගික රීති, දෙපාර්තමේන්තුවේ නියෝග හා පශු වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ |
| 04 දෙපාර්තමේන්තු රෙගුලාසි - 2 | (අ) නිදර්ශක බෙදාහැරීම පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග හා ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව.<br>(ආ) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝකිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බීජෞෂනය මගින් පැටවුන් ලබාගැනීම හා ඇති දැඩි කිරීම, සත්ත්ව පෝෂණය පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය.<br>(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරීකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන් කිරීම, බටර් ගිතෙල් හා මී කිරි නිෂ්පාදනය.<br>(ඈ) ඝාතනාගාරවලදී සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම. |

පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

''දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.''

06. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍රය, අමුණා ඇති ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස ගෙන සකස්කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු වේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

09. විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2016 නොවැම්බර් මස 18 දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. :

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13 ගැටඹේ, පේරාදෙණිය.

11. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් අකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම්කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඉහත විස්තර ඇතුළත් ලිපිය, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන්කොට එය දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීමද සුදුසු වේ. එහිදී අවශ්‍ය තොරතුරු සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුව ගෙවීම අදාළ නම් ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාවය, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණකි. අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. :

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

| | | |
|---|---|---|
| (ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා- | රු. | ශත |
| සම්පූර්ණ විභාගය සඳහා | 1000 | 0 |
| එක් විෂයයකට | 500 | 0 |

මෙම විභාගයට මීට පෙර ඉල්ලුම්කරන ලද හෝ දැනටමත් පෙනී සිට ඇති හෝ අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පළවන නිවේදනයන්හි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ ඇත්නම් එහි දී සිංහල නිවේදනය බලාත්මක වේ.

ඩී. කේ. ආර්. ඒකනායක,
ලේකම්,
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය.

2016 ඔක්තෝබර් මස 28 වැනි දින.

ආදර්ශ අයදුම්පත

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016/17**

FIRST EFFICIENCY BAR EXAMINATION FOR THE OFFICERS IN THE SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE– 2016/17

(විභාගයේ නම ලිපි කවරයේ වමත්පස ඉහළ කෙළවරේ දැක්විය යුතු ය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3 ☐
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා.* : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

02. ලිපිනය (ප්‍රවේශපත්‍ර එවීම සඳහා) :
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

03. ස්ත්‍රී/පුරුෂභාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිලිව සඳහන් කළ යුතු ය.) :

(i) විෂය අංකය : ☐☐ විෂයය :————.

(ii) විෂය අංකය : ☐☐ විෂයය :————.

(iii) විෂය අංකය : ☐☐ විෂයය :————.

(iv) විෂය අංකය : ☐☐ විෂයය :————.

06. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම්, විෂයයන් ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :————.

07. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

08. පදවි නාමය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

දෙපාර්තමේන්තුවේ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

09. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත්කරන ලද දිනය :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

10. ගෙවන ලද විභාග ගාස්තුව : රු. :————.
ගෙවන ලද කාර්යාලය :————.
රිසිට්පත් අංකය :————.

| ලදුපත ඇලවීම සඳහා<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය :————.

(*ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතු ය.)

10-1245/1

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016/17**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 පෙබරවාරි මස ආරම්භ කොට පේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම එකවර ඉදිරිපත් වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශය.*—II වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් II වැනි කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය.

*විභාගය පිළිබඳ විස්තර* :

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය අංකය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1 කොටස | 01 | පැය 03 | 100 | 40 |

හෝ

| | | | | |
|---|---|---|---|---|
| 2 කොටස | 02 | පැය 03 | 100 | 40 |

සහ

| 3 කොටස | | 3 කොටසින් පත්‍ර 2 කට පිළිතුරු සැපයිය යුතු වේ. | | |
|---|---|---|---|---|
| 1 පත්‍රය | 03 | පැය 03 | 100 | 40 |
| 2 පත්‍රය | 04 | පැය 03 | 100 | 40 |
| 3 පත්‍රය | 05 | පැය 03 | 100 | 40 |
| 4 පත්‍රය | 06 | පැය 03 | 100 | 40 |
| 5 පත්‍රය | 07 | පැය 03 | 100 | 40 |
| 6 පත්‍රය | 08 | පැය 03 | 100 | 40 |
| 7 පත්‍රය | 09 | පැය 03 | 100 | 40 |
| 8 පත්‍රය | 10 | පැය 03 | 100 | 40 |
| 9 පත්‍රය | 11 | පැය 03 | 100 | 40 |
| 10 පත්‍රය | 12 | පැය 03 | 100 | 40 |
| 11 පත්‍රය | 13 | පැය 03 | 100 | 40 |

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය අංකය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 1 කොටස | 01 | විෂය නිර්දේශයේ 2:1, 2:2, 4:1, 4:2, 5:2, 5:8, 6:5, 7:2:1, 8:2, 8:2:2, 8:2:3, 8:3:1, 9:2, 9:4, 9:6, 9:7 කොටස් |
| 2 කොටස | 02 | විෂය නිර්දේශයේ 1:1:1:, 1:1:4, 1:2:1, 3:2, 3:1:1, 3:1:2, 3:2:1, 10:1:1, 10:1:2, 10:1:3, 10:1:4, 10:1:6, 10:2:1, 10:2:8 හා 10:4:1 කොටස් |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය අංකය | විෂය නිර්දේශය |
|---|---|---|
| 3 කොටස | | |
| 1 පත්‍රය | 03 | ව්‍යාධි විද්‍යාව |
| 2 පත්‍රය | 04 | පශු සම්පත් ආර්ථික විද්‍යාව |
| 3 පත්‍රය | 05 | පශු මහජන සෞඛ්‍ය |
| 4 පත්‍රය | 06 | කෘෂි ව්‍යාප්තිය |
| 5 පත්‍රය | 07 | ජාන විද්‍යාව හා අභිජනනය |
| 6 පත්‍රය | 08 | සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය |
| 7 පත්‍රය | 09 | සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය |
| 8 පත්‍රය | 10 | සත්ත්ව පෝෂණය |
| 9 පත්‍රය | 11 | තෘණ හා ගෝචර තෘණ |
| 10 පත්‍රය | 12 | ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීව විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව |
| 11 පත්‍රය | 13 | ව්‍යවහාරික, වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිතවේදය |

*සටහන.*—II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අයදුම්කරුවන් පෙනී සිටිය යුත්තේ කොටස 01 හෝ කොටස 02 යන ප්‍රශ්නපත්‍ර දෙකින් එකකට හා කොටස් 03හි සඳහන් ප්‍රශ්නපත්‍ර II න් ප්‍රශ්න පත්‍ර දෙකකට පමණි. සාමාර්ථ්‍යය සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතු ය.

පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

"දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්ය-ක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍යය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළුවීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා

කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය.''

06. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

07. අපේක්‍ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතු ය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතු ය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද, වන ලෙස ගෙන සකස් කළ යුතු වේ. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු වේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හෝ අසම්පූර්ණ හෝ අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්‍ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්‍ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2016 නොවැම්බර් මස 18 දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්ට ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13,
ගැටඹේ, පේරාදෙණිය.

11. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුනු අපේක්‍ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ පිළිබඳව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර ඇතුළත් ලිපියක්, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට එම ලිපිය, සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසීම සුදුසුය. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ලදුපතෙහි පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්‍ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්‍ෂකයාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණකි. අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්‍ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. :—

(අ) ප්‍රථම වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

| | | රු. ශත |
|---|---|---|
| (ආ) | ඉන්පසු එක් එක් වතාව සඳහා- | |
| | සම්පූර්ණ විභාගය සඳහා | 1,000 0 |
| | එක් විෂයයකට | 500 0 |

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි හෝ මීට පෙර ඉල්ලුම් කරන ලද හෝ අපේක්‍ෂකයින් ට ඉහත දැක්වෙන පරිදි අදාළ ගාස්තු ගෙවීමට නියම වේ.

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරය ඇලවිය යුතු ය. තව ද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ද ප්‍රයෝජනවත් විය හැක.

15. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

16. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන් හි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇත්නම් එවැනි විටක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ඩී. කේ. ආර්. ඒකනායක,
ලේකම්,
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳව අමාත්‍යාංශය.

2016 ඔක්තෝබර් මස 28 වැනි දින,
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය.

ආදර්ශ අයදුම්පත්‍රය

**ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016/2017
Second Efficiency Bar Examination for Officers in the Sri Lanka Animal Production and Health Service– 2016/17

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතු ය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

02. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

ස්ත්‍රී - 1 ☐
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

05. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිළිව සඳහන් කළ යුතු ය.) :

(i) විෂය අංකය : ☐☐ විෂයය :————.

(ii) විෂය අංකය : ☐☐ විෂයය :————.

(iii) විෂය අංකය : ☐☐ විෂයය :————.

06. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින් ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි යන්න සඳහන් කරන්න. එසේ නම්, විෂයයන් ද, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න. :————.

07. උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

08. පදවි නාමය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

දෙපාර්තමේන්තුවේ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

09. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත්කරන ලද දිනය :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහළින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

10. ගෙවන ලද විභාග ගාස්තුව : රු.
ගෙවන ලද කාර්යාලය :————.
රිසිට්පත් අංකය :————.

| |
|---|
| ලදුපත ඇලවීම සඳහා<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මඟින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

*අපේක්ෂකයා/අපේක්ෂිකාව නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා
පදවි නාමය.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

දිනය :————.

(*ගාස්තුව නොගෙවන විට දී කපා දැමිය යුතු ය.)

10-1245/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.